

**ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමග හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?**

දිවයින පුරා ශාඛා 276 කින් යුත් ශාඛා ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකාය යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ප්‍රතිඵල අභිමුඛ දක්ෂ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු :

(i) **සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය**

(ii) **සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාර කළමනාකරණ**

(iii) **සහකාර සාමාන්‍යාධිකාරී - විගණන**

### මූලික සුදුසුකම්

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග CA/ CIMA / ACCA වෘත්තීයවේදී සාමාජිකත්වය ලබා තිබීම.
- බැංකුකරණය පිළිබඳ වෘත්තීයවේදී සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- බැංකුකරණ/ මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 12 ක පළපුරුද්ද සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (ප්‍රධාන කළමනාකරු) මට්ටමේ අවම වසර 03 ක පළපුරුද්ද ක් ලබා තිබීම
- අරමුදල් කළමනාකරණය/ අවදානම් කළමනාකරණය/ විගණනය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.
- වයස අවුරුදු 50 ට අඩු විය යුතුය.

## සහකාර සාමාන්‍යාධිකාරී – නීති

### මූලික සුදුසුකම්

- නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ධූරය දැරීම.
- මානව සම්පත් කළමනාකරණයට අදාළ ඩිප්ලෝමාවක් හෝ වෙනත් සමාන අදාළ සුදුසුකමක් සහිත වීම.
- නීති නිලධාරියෙකු ලෙස අවම වසර 12 ක සේවා පළපුරුද්දක් සහ ඉන් වසර 05 ක කළමනාකාරී පළපුරුද්දක් ලබා තිබීම. බැංකු හෝ මූල්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නීති නිලධාරියෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු සියලු නෛතික කටයුතු ආවරණය කිරීමේ පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.
- වයස අවුරුදු 50 ට අඩු විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් හටද ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් යොමු කළ හැකි අතර, ඔවුන් සඳහා වයස් සීමාව අදාළ නොවනු ඇත.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :** 2021 ජූනි මස 04 වන දින

### අයදුම්කරන පිළිවෙළ

මෙම තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික – වෘත්තීමය සහතිකපත්වල පිටපත් සහිතව, ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.එම අයදුම්පතෙහි නම, ලිපිනය, දුරකථන අංකය සහිතව ඥාතීන් නොවන වෘත්තීමය පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු ද ඇතුළත් කර එවිය යුතු අතර, තැපෑලෙන් යොමු කරන්නේ නම් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රය බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නැතහොත් එම අයදුම්පත් careers@rdb.lk යන ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

**සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී,**
**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,**
**අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.**

0112 42 52 62 | www.rdb.lk